ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්වවිද්‍යාලය විසින් හා විශ්වවිද්‍යාලයට එරෙහිව පවරා ඇති විභාග වෙමින් පවතින නඩු 03 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 100 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	විභාග වෙමින් පවතින නඩු කටයුතු 03 ක් සම්බන්ධයෙන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේදී මඟ හැරී ඇති බැවින් ඒ සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීමට අදාළ කටයුතු සිදු කරනු ලබන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජංගම නොවන වත්කම් වල ඇතුළත් ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Quality Improvement Projects) යටතේ Strengthen Research වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.2,365,142ක් වූ ශේෂය වර්ෂය තුළදීම සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කර තිබුණ ද ඊට අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.	ජංගම නොවන වත්කම් වල ඇතුළත් වර්ෂයට අදාළ පර්යේෂණ වියදම සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කර ඇති අතර ක්‍රමක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව.	ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	Centre of Excellence in Sustainable Tourism (CESTour) ව්‍යාපෘතිය හා පර්යේෂණ ව්‍යාපෘති යටතේ සමාලෝචිත වර්ෂය තුළ දී මිල දී ගෙන තිබූ පිළිවෙලින්	ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මකව පැවතීම හේතුවෙන් 2024 වර්ෂයේදී මිලදී ගන්නා ලද E-Books වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර	වත්කම් නිවරදිව ප්‍රාග්ධනිත කළ යුතුය.

	වටිනාකම රු.3,701,180 ක් වූ E-Books හා වටිනාකම රු.855,500ක් වූ Ultrasonic Probe Sonicator යන්ත්‍රය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	නොමැත. අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ සහතිකය නිකුත් කළ පසු එම ව්‍යාපෘතියට අදාළ වත්කම් විශ්වවිද්‍යාලයට පවරා ගෙන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන බව.	
(ආ)	සිංහරාජ ව්‍යාපෘති ප්‍රදාන අරමුදල් හා විශ්වවිද්‍යාලයේ අරමුදල් 10 ක පවතින මුදල් ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඉපයූ රු.13,484,063ක පොලී ආදායම වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	සිංහරාජ ව්‍යාපෘති ප්‍රදාන සහ විශේෂිත අරමුදල් වලට අදාළව ආරම්භ කර ඇති ස්ථාවර තැන්පතු සඳහා වන පොළිය විශ්වවිද්‍යාලයේ විවිධ ආදායම් යටතේ ගිණුම්ගත නොකර අදාළ ව්‍යාපෘති ගිණුමට සහ විශේෂිත අරමුදල් ගිණුම්වලට බැර කරනු ලැබේ. සිංහරාජ ව්‍යාපෘතියට අදාළව ලද පොලී ආදායමෙන් එම ව්‍යාපෘතියට අදාළ නිශ්චිත වියදම් මූල්‍ය කමිටුව විසින් අනුමත කරන ලද අයවැය ලේඛනයට අනුකූලව දරනු ලබන බව.	කාලච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කළ යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂයට අදාළව ගෙවන ලද රු.1,281,480ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.	2023 වර්ෂයට අදාළ වියදමක් වුවද, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා 2024.01.15 වන දින වන විට බිල්පත්/ඉන්වොයිස් නොලැබීම නිසා උපචිත වියදම් යටතේ වෙන් කිරීම් සිදු කර නොමැත.	වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	ආපනශාලාවේ සේවය කරන සේවකයින් වෙනුවෙන් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවීම් කරන ලද විශ්වවිද්‍යාල අරමුදලට අයවිය යුතු රු.11,154,355 ක මුදල අයවිය යුතු ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ආපනශාලාවෙන් පිටත පිරිසිදු කිරීම සඳහා වැය කළ රු.3,279,892 ක් අඩු විය යුතු අතර ඉවුම් පිහුම් කටයුතු කරන සේවකයින් සඳහා කරන ගෙවීම් 2024 පෙබරවාරි 20 දින සිට අත්හිටුවන ලදි. එතෙක් කළ ගෙවීම් නැවත අය කර ගැනීමට අදාළ පාර්ශවයන් වෙත දැනුම් දී ඇති අතර ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති බව.	විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් නිවරදිව හඳුනාගෙන අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන හා අයභාර වියදම් වෙනුවෙන් ගෙවිය යුතු පිළිවෙලින් රු.780,290ක් හා රු.932,085ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2025.01.10 දින වන තෙක් ප්‍රාග්ධන වැඩ සඳහා ගෙවිය යුතු අවසන් බිල්පත් වටිනාකම නිශ්චිතව තීරණය නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයට අදාළව විවිධ ණයහිමියන් යටතේ අදාළ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොකරන ලද බව.	කාලච්ඡේදයට අදාළ ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඊ)	2022 ඔක්තෝම්බර් 12 දින වැඩ නිමකර විශ්වවිද්‍යාලයට භාරදී තිබුණු වටිනාකම රු.81,729,192ක්වූ විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතියේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ ගිණුම් ගත කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වාර්ෂිකව ක්ෂය කර නොතිබුණි .	විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීමට අදාළ පිරිවැයක් බැවින් ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ ප්‍රාග්ධනිත කරන ලද බව.	නිවැරදි වත්කම් කාණ්ඩය යටතේ හඳුනාගෙන වාර්ෂිකව ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් බිල්පත් ගෙවීමට ප්‍රමාදවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.5,078,042ක ප්‍රමාද ගාස්තු ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රමාද ගාස්තු ගෙවීම සම්බන්ධ අවසන් තීරණයක් ගෙන නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තුව වෙනුවෙන් වෙන් කිරීමක් සිදු නොකරන ලද බව.	ප්‍රමාද ගාස්තුව නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට අදාළව ජංගම ගිණුම් 05 කට අදාළව එකතුව රු.4,167,872 ක් වූ හඳුනා නොගත් තැන්පතු 129 ක් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	හඳුනා ගැනීමට නොහැකි වූ තැන්පතු 2025 වර්ෂයේ අනෙකුත් ආදායම් ලෙස ගිණුම්ගත කරන ලද අතර ඉතිරි තැන්පතු ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි ඇතුළත් හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම	අනුරූපී වාර්තා අනුව වටිනාකම	වෙනස	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පශ්චාත් උපාධි පාඨමාලා ආදායම	රු.22,544,423	රු.22,066,723	රු.477,700	මෙම වෙනසට හේතුවී ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පශ්චාත් උපාධි පාඨමාලා ආදායම තුළ අධ්‍යයන පිටපත් සඳහා ලැබීම්, කල් ඉකුත් වූ චෙක්පත් නැවත ආදායම් ලෙස වාර්තා කිරීම් සහ ස්ථාවර තැන්පතු සඳහා ලද පොලී ආදායම් අන්තර්ගත බව.	මූල්‍ය ප්‍රකාශන ශේෂ සමඟ අදාළ අංශයන්හි තොරතුරු සැසඳිය යුතුය.

1.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රයේ VII පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා ගෙවල් කුලී දීමනා ගෙවීමට විශ්වවිද්‍යාලය කටයුතු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 126 දෙනෙකු වෙනුවෙන් ගෙවූ රු.8,759,354 ක ගෙවල් කුලිය ද ඇතුළුව 2017 ජනවාරි 01 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු.89,140,826ක් ගෙවා තිබුණි.	කැබිනට් පත්‍රිකා අංක 2004/ED/HE/45 ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා කාර්යමණ්ඩලය සඳහා නවාතැන් පහසුකම් සලසා දීමට මුල් අවස්ථාවේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව නේවාසිකාගාර ලබාදී ඇත. සේවක සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ විශ්වවිද්‍යාලයේ නිවාස කමිටුවේ නිර්දේශ මත පාලක සභාව විසින් ගත් තීරණයක් අනුව 2017 වසරේ සිට නිලධාරීන් විසින් ගෙවනු ලබන නිවාස කුලියෙන් කොටසක් ප්‍රතිපූරණය කරන ලද බව.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රය අනුව කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි104(1)	එකතුව රු.3,368,398 ක් වූ පරිගණක උපාංග අයිතම 98 ක් ඒවා ලබා දී තිබුණු දෙපාර්තමේන්තු හෝ අංශවල භෞතිකව නොමැති බවට ප්‍රත්‍යාගණන කමිටුව විසින් හඳුනාගැනීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර තිබුණද ඊට හේතු නිශ්චය වශයෙන් දැන ගැනීම හා වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා වූ පරීක්ෂණ ආරම්භ කිරීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	මෙම පරිගණක උපාංග අයිතම 98 අතරින් අයිතම 40ක් UPS අයිතම වේ. ඒවා භෞතිකව පවතින්නේද යන්න අදාළ අංශ වෙතින් විමසීමක් සිදු කර ඇති අතර ඒ අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව.	අස්ථාන ගතවී ඇති පරිගණක හා උපාංග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	මුදල් රෙගුලාසි 571	විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා සඳහා ගෙවීමේදී රඳවා ගන්නා ලද එකතුව රු.23,953,831ක් වූ කල් ඉකුත්වූ අතුරුදවුම් 54 ක් මුදල් රෙගුලාසි අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාළ සැපයුම්කරුවන්ට 2024 වර්ෂයේ නැවත සිහිකැඳවීම් ලිපි යවා ඇත. ඒ සඳහා ප්‍රතිචාර දක්වන සැපයුම්කරුවන් වෙත නිදහස් කිරීමට කටයුතු කරන අතර ඉතිරිය රාජ්‍ය ආදායමට බැර කරනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය			
(i)	V පරිච්ඡේදයේ 7.6 හා 7.8 වගන්ති	2024 දෙසැම්බර් 31 දින වන විට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.106,248,535ක් අයකරගැනීමටත්, ඔවුන් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කළ යුතු බවට බලධාරීන් දැනුවත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.	අදාළ නිලධාරීන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව අදාළ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	VII පරිච්ඡේදයේ 7.3(අ) වගන්තිය හා 2019 නොවැම්බර් 25 දිනැති අංක 2019/09 දරන ආයතන චක්‍රලේඛ ලිපියෙහි 1.i වගන්තිය	විශ්වවිද්‍යාලය සතු නිල නිවාස ලබා දීමේදී නිලධාරියාගේ මාසික මූලික වැටුපෙන් සියයට 10 කට සමාන මුදලක් අය කිරීම වෙනුවට විශ්වවිද්‍යාලය විසින් පනවාගත් අතුරු ව්‍යවස්ථා මත නිල නිවාස කුලී අය කිරීම හේතුවෙන් උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් 69 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.4,587,777 ක් අඩුවෙන් නිල නිවාස කුලී අයකරගෙන තිබුණි.	විශ්වවිද්‍යාල චක්‍රලේඛ ප්‍රකාරව අය කිරීම් සිදු නොවුනද විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත නිවාස කමිටුවේ හා පාලක සභාවේ අනුමැතිය මත අය කිරීම් සිදු කරනු ලබන බව.	ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය
(ඇ)	2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම, ව්‍යවහාරික විද්‍යා, කළමනාකරණ සහ තාක්ෂණික අධ්‍යයන පීඨයන්හි 2023/2024 අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකයේ අවසන් විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මාස 05 සිට මාස 07 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. දෙවැනි සමාසිකයේ පළමු, දෙවන හා තෙවන වසර විභාග පවත්වා 2025 මාර්තු 31 දින වන විට ප්‍රමාද කාලය මාස 06ක් ඉක්මවා තිබුණ ද	විශ්වවිද්‍යාලයේ සිසුන් වැඩි වීමට සාපේක්ෂව අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, ඉල්ලා අස්වූ කාර්ය මණ්ඩලය වෙනුවට හෝ බඳවා ගැනීම් සිදු කිරීමට ඉඩ ලබා නොදීම වැනි හේතූන් මත බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදුවූ බව.	අදාළ චක්‍රලේඛය අනුව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

		ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ඈ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.3 ඡේදය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මාසික කුලී පදනම මත ලබාගත් වාහන 18 ක් සඳහා විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු 31 දින දක්වා එකතුව රු.19,910,057 ක කුලී ගෙවා තිබුණි.	විශ්වවිද්‍යාල කටයුතු සඳහා වාහන මිලදී ගැනීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කළ අතර ඒ සඳහා මහා භාණ්ඩාගාරය විසින් කුලී පදනම මත වාහන පාවිච්චි කරන ලෙස අවසර ලබා දී ඇති බව.	අදාළ චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් මගින් තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළ දී වැටුප් හා දීමනා ලෙස රු.1,165,814,127 ක් ගෙවා තිබුණි.	සෑම මසකම අවසානයේ දී වැටුප් හා වේතන ගෙවීමට පෙර වැටුප් අංශය මගින් අදාළ අධ්‍යයන අංශ ප්‍රධානීන්ගෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් ලබා ගනු ලබන බව.	අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දරන මුදල් අමාත්‍යාංශ ලිපිය	මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව විදේශ ප්‍රදාන මත ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඉන් ව්‍යාපෘති 03ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.53,323,221 ක විදේශ ප්‍රදාන ලැබී තිබුණි. මීට අමතරව වෙනත් විදේශ ව්‍යාපෘති 02ක් මගින් රු.22,822,930ක් වටිනා භාණ්ඩ සෘජුවම විශ්වවිද්‍යාලයට ලබාගෙන තිබුණි.	2024 වර්ෂය තුළදී ලබාගෙන තිබෙන විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(උ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/ HRD/ 126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාශයේ ලේකම් අමතන ලද චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය	බැඳුම්කර ගිවිසුම් උල්ලංඝණය කිරීම මත ආචාර්යවරුන් 10 දෙනෙකුගෙන් 2023 හා 2024 වර්ෂවලදී අයකරගෙන තිබුණු රු.25,525,852ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 ට අනුකූලව කටයුතු කෙරේ. එම චක්‍රලේඛය මේ දක්වා අත්හිටුවා නොමැති බැවින් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සිදු කළ නොහැකි බව.	චක්‍රලේඛය අනුව අයකර ගත් මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ යුතුය.

(ඌ)	2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.3,684,088,688 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	එක් එක් කාණ්ඩයේ වත්කම් ප්‍රත්‍යාගණනය අවසන්කර ස්ථාවර වත්කම් මෘදුකාංගය යාවත්කාලීන කිරීමට තීරණය කරන ලද බව. මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනය සාමාන්‍ය පරිපාලන අංශය මඟින් නියමිත පරිදි නඩත්තු කරන බව.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.65,566,469 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.310,420,127 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.375,986,596 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ප්‍රාග්ධන ආදායම අඩුවීම හා මුළු වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශ්වවිද්‍යාලය සතුව ඌන උපයෝජිත, නිෂ්කාර්ය හා අලුත්වැඩියාකර භාවිතයට ගත හැකි තත්ත්වයේ Digital Duplicator යන්ත්‍ර 13 ක් තිබිය දී, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී පැරණි මාදිලියකට අයත් Digital Duplicator යන්ත්‍ර 07 ක් මිල දී ගෙන රු.6,979,700ක අනාර්ථික වියදමක් සිදු කර තිබුණි.	2024 මාර්තු 28 පැවති 114 වන මූල්‍ය කමිටුවේදී මෙම යන්ත්‍ර මිලදී ගැනීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීමටත් පොදු පිරිවිතරයන් සකස් කිරීමටත් පීඨාධිපතිවරු තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදි. ඒ අනුව එම කමිටුවේ සභාපතිගේ නිර්දේශය සහිතව පිරිවිතර සකස් කොට (Shopping Procurement Method) නියමිත පරිදි අනුගමනය කොට මෙම යන්ත්‍ර මිලදී ගෙන ඇත.	අනාර්ථික වියදම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කොට විශ්වවිද්‍යාල අරමුදල සඳහා අලාභයක් සිදුව ඇත්නම් එය ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	ඉකුත් වර්ෂවලදී මිලදී ගෙන භාවිතයට නොගත් ඇඳන් සහ මෙට්ට විශ්වවිද්‍යාල නේවාසිකාගාර තුළ ගොඩගසා තිබියදී සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ දී වටිනාකම රු.1,647,000ක් වූ මෙට්ට 300ක් මිලදී ගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෙට්ට 173ක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.	2023.11.08 දින නියෝජ්‍ය ලේඛකාධිකාරී (පොදු පරිපාලන) විසින් 2023/2024 අධ්‍යන වර්ෂයට පෙර ශිෂ්‍යයන්ට නේවාසිකාගාර පහසුකම් ලබාදීමේදී මෙට්ට මිලදී ගැනීමට උපකුලපතිතුමා වෙත ඉල්ලීම් ලිපියක් යොමුකර ලබා ගත් අනුමැතිය මත මිලදී ගෙන ඇති බව.	විශ්වවිද්‍යාල අරමුදල සඳහා වූ අලාභය ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් නැවත අයකර ගත යුතුය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ටෙන්ඩර් කොන්දේසි අනුව, ආපනශාලා සේවාව නිසියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවකයින් සේවයේ යෙදවීමටත් නීත්‍යානුකූල වේතන ගෙවීමටත් ආපනශාලාව ඇතුළත හා ඉන් පිටත දිනපතා පිරිසිදු කිරීමටත් කොන්ත්‍රාත්කරුවන් එකඟ වී තිබිය දී, ඉවුම් පිහුම් කටයුතු සඳහා බඳවා ගෙන තිබුණු සේවකයින් 13 දෙනෙකුට රු.7,874,463ක් ද ආපනශාලා ඇතුළත හා පිටත පිරිසිදු කිරීමේ කටයුතු වෙනුවෙන් පවිත්‍රතා සේවයට අයත් සේවකයින් 08 දෙනෙකු වෙනුවෙන් රු.3,279,892ක් ද වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. මේ අනුව 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් වැයකරන ලද එකතුව රු.11,154,355ක් විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් වී තිබුණි.	ආපනශාලාවල ඉවුම් පිහුම් කටයුතු සඳහා ලබා දී තිබූ සේවකයින් සඳහා කරන ගෙවීම් 2024 පෙබරවාරි 20 දින සිට අත්හිටුවන ලද අතර එතෙක් සිදු කරන ලද ගෙවීම් නැවත අය කර ගැනීමට අදාළ පාර්ශවයන් වෙත දැනුම් දුන් නමුත් ඔවුන් විසින් එය නැවත ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. එබැවින් ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇති බව. ආපනශාලාව පිටත පිරිසිදු කිරීම විශ්වවිද්‍යාලය විසින් සිදු කළ යුතු බැවින් ඔවුන් වෙනුවෙන් කළ ගෙවීම නිවැරදි බව.	විශ්වවිද්‍යාල අරමුදල සඳහා සිදු වූ අලාභය ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අය කිරීමට පියවර ගත යුතුය.
(ආ)	උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ කාර්යමණ්ඩල සංවර්ධනය කිරීමේ අරමුණින් ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා රු.35,729,187 ක් වැය කර තිබූ කථිකාචාර්යවරුන් 04 දෙනෙකු සේවය අතහැර යාම හේතුවෙන් ඔවුන් වෙනුවෙන් වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.	කථිකාචාර්යවරු සඳහා වැය කළ රු.38,236,650ක්වූ ශිෂ්‍යත්ව වටිනාකම් ඔවුන්ගේ බැඳුම්කර වටිනාකමට ඇතුළත් කොට ඇති බැවින් එම මුදල ඔවුන්ගෙන් අය කර ගැනිමට කටයුතු කරන බව.	ව්‍යාපෘතිය යටතේ දැරූ නිෂ්කාර්ය වියදම් කඩිනමින් අයකර ගැනීමටත්, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ඇ)	2016 මාර්තු 30 දිනැති අංක UGC/IDD/GEN/01 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ලිපිය අනුව 2017 දෙසැම්බර් 06 දින සිට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අධීක්ෂණය සඳහා විශ්‍රාමික පළාත් ඉඩම් කොමසාරිස්වරයකු බඳවා ගෙන තිබූ අතර ගෙවීම් කිරීමේ දී 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.4,128,333 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබියදී අතිරේක නිලධාරියෙකු බඳවාගෙන විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් සිදුකර තිබුණි.	විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම සඳහා භුක්තිය බාරගත් ඉඩම් වල අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහාත් එම පවරා ගැනීමේ කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහාත් විශේෂඥ දැනුම ඇති විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත 2017 දෙසැම්බර් 11 වන දින පත් කර ගන්නා ලදී. විශ්වවිද්‍යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතින බැවින් 2024 නොවැම්බර් මස 04 දින සිට 2025 මැයි මස 03 දින දක්වා පැවරුම් පදනම මත මොහු තවදුරටත් සේවයේ යොදවා ඇත.	ඉඩම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. එහෙත් අවිධිමත් බඳවා ගැනීමට අදාල වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය පරීක්ෂාවන් සිදුකළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022/2023 හා 2023/2024 අධ්‍යයන වර්ෂ සඳහා උපාධි පාඨමාලා 16 ක් වෙනුවෙන් සිසුන් 3328 දෙනෙකු ලියාපදිංචිකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදී තිබුණ ද, සිසුන් 2645 දෙනෙකු පමණක් ලියාපදිංචිවී තිබීම හේතුවෙන් සමස්ථ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, එය අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ලියාපදිංචි නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 21 ක් වූ අතර උපාධි පාඨමාලා සඳහා කිසිඳු විදේශ සිසුවෙකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි.	විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලද ශිෂ්‍ය ලියාපදිංචි ලැයිස්තු අනුව උපාධි පාඨමාලාවන්ට සිසුන් බඳවා ගැනීමට කටයුතු කරන බව.	අදාළ පාඨමාලා සඳහා අනුමත සිසුන් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සිසුන් 2287 න් සිසුන් 1783 දෙනෙකු සඳහා කුලී පදනම මත නේවාසිකාගාර 64ක් ලබාගෙන වාර්ෂික කුලිය ලෙස රු.87,354,376 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණි. නව ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකිරීමට අවධානය යොමු නොවීම හේතුවෙන්, 2008 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වැය කර තිබුණු නේවාසිකාගාර කුලී වියදම් එකතුව රු.376,153,028 ක් වූ අතර එම සෑම නේවාසිකාගාරයක් සඳහාම ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා	සිසුන් 502 දෙනෙකුට නේවාසිකාගාර පහසුකම් ඉදිකර ඇති අතර අනෙක් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය අවටින් නේවාසික පහසුකම් සපයා දී ඇත. 2015 වසරේ සිට නේවාසිකාගාර ඉදි කිරීමට කටයුතු කරන අතර අක්කර 12 ක ඉඩමක් පවරා ගෙන සිසුන් 2000කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අපේක්ෂා කරන බව.	නව ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකර ශිෂ්‍යයන් සඳහා ආරක්ෂිත හා පහසුකම් සහිත නේවාසිකාගාර පහසුකම් ලබා දීමටත් ඉන් අමතර වියදම් අවමකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

	මෙන්ම ජලය, විදුලිය යන වෙනත් උපයෝගීතා සේවාවන් ද ලබා දීමට සිදු වී තිබුණි.		
(ඇ)	පරිගණක හා උපකරණ ප්‍රත්‍යාගණන කමිටුව විසින් 2023 දෙසැම්බර් 20 දින උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව විවිධ ප්‍රදාන යටතේ මිල දී ගෙන තිබූ එකතුව රු.3,928,819ක් වටිනා පරිගණක උපාංග අයිතම 34 ක් හා විද්‍යාගාර ඉගැන්වීම් උපකරණ 02 ක් අලුත්වැඩියා කර භාවිතයට ගතයුතු බවට හඳුනාගෙන තිබුණ ද එම උපාංග 2024 දෙසැම්බර් 31 දින වන විටත් අලුත්වැඩියා කිරීමට හෝ ඊට අදාළ අංශ වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.	ඒ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොදු පරිපාලන අංශය වෙත උපදෙස් ලබා දී ඇති බව.	පරිගණක උපාංග කඩිනමින් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ විශ්වවිද්‍යාලයට ප්‍රතිපාදන ලබාදී තිබියදී, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා ගෙවීම් කිරීම ප්‍රමාද කිරීම හේතුකොටගෙන එකතු කළ අගය මත බදු වශයෙන් රු.750,346 ක් සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුට අමතරව ගෙවීමට සිදුවී තිබුණු අතර ප්‍රමාදය මත කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා ව්‍යාපෘතියේ උපදේශක විසින් 2023 ඔක්තෝබර් 19 දින සහතික කර තිබුණු ප්‍රමාද ගාස්තුව රු.5,078,042 ක් විය. තවද ප්‍රමාද ගාස්තු සම්බන්ධ ආරවුල නිරාකරණය කර ගැනීම වෙනුවෙන් දෙපාර්ශවය විසින් රු.500,000 ක් බැගින් ගෙවා ආරවුල් තීරකවරයකු (Dispute Adjudicator) පත් කරගෙන තිබුණු අතර ඉහත ගෙවීම් වලට අමතරව තවදුරටත් රු.3,643,953 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට තීරක විසින් නියම කර තිබුණි.	විශ්වවිද්‍යාලය සහ කොන්ත්‍රාත්කරු අතර ප්‍රමාද ගාස්තු ගෙවීම සම්බන්ධ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා පත්කරගනු ලැබූ ආරවුල් තීරකගේ නිර්දේශ සම්බන්ධයෙන් 2025.02.28 දින රැස්වූ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් තීරණය කරනු ලැබුවේ නීතිපති උපදෙස් ලබා ගෙන මේ සම්බන්ධයෙන් ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලෙසයි.	ප්‍රමාද ගාස්තු සම්බන්ධ ගැටළුව කඩිනමින් නිරවුල් කර ගැනීමටත් ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු පිළිවෙලින් 86 ක් හා 77 ක් ද, ව්‍යවහාරික විද්‍යා පීඨය හා වෛද්‍ය පීඨය සඳහා අනුමත තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු පිළිවෙලින් 05 ක් හා 03 ක් ද පුරප්පාඩුව පැවති අතර අනෙකුත් පීඨයන්හි අනුමත තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 13ක අතිරික්තයක් පැවතුණි.	නව බඳවා ගැනීම් කටයුතු තාවකාලිකව නවතා ඇති බැවින් අදාල අනුමැතිය ලැබුණු පසු බඳවා ගැනීමට කටයුතු කරන බව. ස්ථිර සේවකයින් ඉවත්ව යාම සහ අනුමත ස්ථිර තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට නොහැකි වීම හේතුවෙන් අදාළ පුරප්පාඩු සඳහා තාවකාලික පදනමින් බඳවා ගැනීමට කටයුතු කර අධ්‍යයන කටයුතු නිසියාකාරව පවත්වා ගෙන යන බැවින් එය අධ්‍යයන කාර්ය මණ්ඩල අතිරික්තයක් නොවේ.	අනුමත කාර්ය මණ්ඩලය තුළ කටයුතු කරමින් අත්‍යාවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු අයදුම්කරුවෙකු 2008 සැප්තැම්බර් 05 දින ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට බඳවාගෙන තිබුණු අතර පත්වීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද සඳහා ඉදිරිපත් කර තිබුණු සහතිකවල නිරවද්‍යතාවය හා පත්වීම් ලිපියෙහි සඳහන් කොන්දේසි සපුරා ඇති බවට සනාථ කර ගැනීමකින් තොරව 2012 ජූලි 13 දින සිට ඔහුගේ සේවය ස්ථිර කර තිබුණි. ඔහු 2019 ඔක්තෝබර් 07 දින සිට නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරට උසස්කර, එදින සිට එම තනතුරේ ස්ථිර කිරීමටත් කටයුතු කර තිබුණි. තවද මෙම නිලධාරියා සඳහා 2008 ඔක්තෝබර් 15 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.25,658,781 ක් ගෙවීමටත්, අංක 01/2016 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය යටතේ සහනදායී කොන්දේසි මත සියයට 50 ක බදු නිදහස් ඇමරිකානු ඩොලර් 30,000 ක් වටිනා මෝටර් වාහනයක් ආනයනය හෝ මිල දී ගැනීම වෙනුවෙන් වාහන බලපත්‍රයක් ලබා දීමටත්, විදේශ පුහුණු හා රැස්වීම් සඳහා සහභාගී වීමේ අවස්ථා ඇතුළු පහසුකම් සලසා දීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර තිබුණි.	අදාළ තනතුරු වලට පත්කිරීමේ, පත්කිරීම් බළධාරියා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වන අතර විශ්වවිද්‍යාලය විසින් නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරෙහි ස්ථිර කරන අවස්ථාවේදී ඔහු විසින් ඉදිරිපත් කොට තිබූ අධ්‍යාපන සුදුසුකම්වල නිරවද්‍යතාවය අදාළ ආයතන වෙතින් සනාථ කරගෙන ඇති බව. තනතුරට අදාළ රාජකාරී නිසි ලෙස සතුටුදායක අන්දමින් සිදු කර ඇති බැවින් එම තනතුරු වලට අදාළව දෙනු ලබන වැටුප්, දීමනා සහ සහනදායී ප්‍රතිලාභ ආදිය ලබා දී ඇති බව.	අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකොට ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත් සිදු වූ අලාභය අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ඇ)	නැවත පුවත්පත් දැන්වීම් පළකර අයදුම්පත් කැඳවිය යුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුම් දී තිබිය දී, කළමනාකරණ අධ්‍යයන පීඨයේ ENGLISH LANGUAGE & LINGUISTICS විෂයය සඳහා තෙවන කාණ්ඩය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අයදුම්කරුවන් දෙදෙනෙකු කථිකාචාර්ය (තාවකාලික) තනතුර සඳහා 2024 ජනවාරි 16 දින බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දී රු.1,924,338 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණු අතර ENGLISH LANGUAGE & EDUCATION විෂයය සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලය බඳවා ගැනීමේ දී සුදුසුකම් සහිත පළමු කාණ්ඩයට අයත් අයදුම්කරුවන් සිටිය දී දෙවන කාණ්ඩය යටතේ වූ අයදුම්කරුවෙකු 2024 මාර්තු 15 දින සිට කථිකාචාර්ය (තාවකාලික) තනතුර සඳහා බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දී රු. 791,560 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 08/2005 හා 17/2017 හි විධිවිධාන පරිදි ඒ සඳහා වූ විශේෂ සාධාරණීකරණ හේතූන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඊට අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබෙන තෙක් පාලක සභාවේ අනුමැතියට යටත්ව කථිකාචාර්ය (තාවකාලික) ලෙස බඳවා ගෙන තනතුරට හිමි වැටුප් හා දීමනා ගෙවා ඇති බව. ENGLISH LANGUAGE & LINGUISTICS විෂයය සම්බන්ධයෙන් 2024.11.08 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එවන ලද 2024.07.18 වන දිනැති UGC/HR/4/4/26/Mgt දරන ලිපියට පිළිතුරු යවා ඇතත් මෙතෙක් ඊට පිළිතුරු ලැබී නොමැති බව. ENGLISH LANGUAGE & EDUCATION විෂයය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට 2024.02.19 වන දින ලිපියක් යොමු කර ඇති අතර ඊට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් 2024.04.08 දිනැති අංක UGC/HR/4/4/26/Mgt දරන පිළිතුරු ලිපිය ලද අතර ඒ සඳහා 2024.11.08 වන දින පිළිතුරු යවා ඇති අතර එම ලිපියට මේ දක්වා පිළිතුරු ලැබී නොමැති බව.	අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකොට ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත් සිදු වූ අලාභය අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	2009 මාර්තු 02 දින සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවාගෙන තිබුණු නිලධාරිනියක පරිවාස කාලය තුළ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2017 මාර්තු 02 දින සේවයෙන් ඉවත් කර, එදින සිට 2018 ජූලි දක්වා කොන්ත්‍රාත් පදනම මත සහකාර පුස්තකාලයාධිපති තනතුරේ පිහිටුවා මාසිකව රු.51,130 ක දීමනාවක් ගෙවීම් කර තිබුණි. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා 2018 වර්ෂයේ දී සිදු කළ විවෘත බඳවා ගැනීම් යටතේ 2010 අප්‍රේල් 23 දිනැති අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පරිදි සුදුසුකම් සපුරා නොතිබුණු මෙම නිලධාරිනිය 2018 අගෝස්තු 01 දින සිට සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා පත් කර, 2021 අගෝස්තු 01 දින සිට ජ්‍යෙෂ්ඨ සහකාර	අවශ්‍ය සුදුසුකම් නොමැති බවට වූ රජයේ විගණන විමසුමද, විගණන සහ කළමනාකරණ කමිටුවේ දී අදාළ නිළධාරිනියගේ සුදුසුකම් බඳවා ගැනීමේ පරිපාටිය සමඟ නොගැළපෙන බවට වූ යෝජනාවද හේතුවෙන් මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලක සභාවට යොමු කරන ලෙස යෝජනා විය. ඒ අනුව සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත් කළ අතර පාලක සභා පත්‍රිකා අංක C/180/05/25 මගින් අනුකමිටුව විසින් ඉදිරිපත් කළ නිරීක්ෂණ සහ නිර්දේශ පහත පරිදි වේ. පරිවාස කාලය තුළ ආචාර්ය උපාධිය	සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතු අතර අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකොට ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සහ සිදු වූ අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

පුස්තකාලයාධිපති තනතුර සඳහා පත් කිරීමටත් 2022 මාර්තු 02 දින සිට වැඩබලන පුස්තකාලයාධිපති තනතුර සඳහා පත්කිරීමටත් කටයුතු කර තිබුණි. තවද, 2018 අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.21,423,102ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර නිල නිවාස, මාසික කුලී පදනම යටතේ ලබාගත් නිල වාහනයක් සහ ඉන්ධන දීමනා ලබා දී තිබුණි. නැවත බඳවා ගන්නා අවස්ථාව වන විට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට ගෙවිය යුතුව තිබුණු රු.5,491,082ක මුදලින් රු.1,372,770 ක් පමණක් අයකර ඉතිරිය වූ රු.4,118,312 ක් සඳහා 2014 මාර්තු 24 දිනැති අංක 03/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව නැවත බැඳුම්කර ගිවිසුමක් ඇති කර ගැනීමටත් කටයුතු කර තිබුණි.

සම්පූර්ණ කළ නොහැකි වූ බැවින් 2017 මාර්තු 02 දින සිට සේවය අවසන් කිරීමට හා 2017 මාර්තු 02 සිට 2018 මාර්තු 01 දක්වා කොන්ත්‍රාත් පදනම මත සහකාර පුස්තකාලයාධිපති තනතුර ලබා දීමටත් එය 2018 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමටත් කටයුතු කර ඇති බව.

- ''ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති II ශ්‍රේණිය'' තනතුර සඳහා 2018 ජනවාරි 21 වන දින ජාතික පුවත්පත්හි පල කළ දැන්වීම අනුව ඇය අයදුම් කළ අතර බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය සහ පුස්තකාලයාධිපති නිර්දේශය මත ඇය සුදුසුකම් ලබා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලදී. ඒ අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුරට පත් කිරීමට තේරීම් කමිටුව නිර්දේශ කිරීම මත 2018 අගෝස්තු 01 දින සිට ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුරට නැවත බඳවා ගන්නා ලදී.

ඇය විසින් සපුරා ඇති ආචාර්ය උපාධි සුදුසුකම සැලකිල්ලට ගෙන පාලක මණ්ඩලය 2018 වසරේදී ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුරට කළ බඳවා ගැනීමට
වසර හයක පළපුරුද්ද 2018 අගෝස්තු 01 දින සිට වසර තුනක කාලයක් සහකාර පුස්තකාලයාධිපති තනතුරට (සංක්‍රාන්ති ශ්‍රේණියට) ඇතුළත් කර 2021 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (II ශ්‍රේණිය) තනතුරට උසස් කිරීම ලෙස සංශෝධනය කිරීමට 180 පාලක සභාව තීරණය කර ඇත.

(ඉ)	පුහුණු තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය “ආ” කාණ්ඩයේ තනතුරකට 2016 අප්‍රේල් 01 දින පත්වීම ලද අයදුම්කාරිය විසින් ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට තහවුරුකර ගැනීමට විශ්වවිද්‍යාලය 2021 ඔක්තෝම්බර් දක්වා ප්‍රමාදවී තිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.3,275,787 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. සහතික පත් නියමිත කාලය තුළ සනාථ කර නොගෙන ගෙවීම් කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, විශ්වවිද්‍යාල අරමුදලට වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.	විභාග ප්‍රතිඵල විෂමතාවය පිළිබඳ පරීක්ෂණයක් සිදු කිරිම සඳහා 2021.07.07 දින බදුල්ල පළාත් භාර නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙත පැමිණිලි කළ අතර ඊට අදාළ විමර්ශන කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින බව. බදුල්ල පොලිස් ස්ථානයේ විශේෂ අපරාධ විමර්ශන අංශ ස්ථානාධිපතිතුමා විසින් බදුල්ල ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර නඩු කටයුත්තක් ආරම්භ කර ඇත. ගරු මහෙස්ත්‍රාත් අධිකරණය ලබා දෙන නඩු තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, විශ්වවිද්‍යාල අරමුදලට වූ අලාභය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඊ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික නිලධාරී තනතුරක් අනුමත කර නොතිබිය දී ප්‍රාග්ධන වැඩ සහ ගොඩනැගිලි හා නඩත්තු අංශ සඳහා පාලක සභා අනුමැතිය මත අවම අධ්‍යාපන සුදුසුකම් හෝ සපුරා නොතිබුණු වයස අවුරුදු 49 ඉක්ම වූ අයෙකු 2019 අප්‍රේල් 10 වන දින සිට බඳවාගෙන දෛනික පැමිණීම සහ පිටවීම සනාථ කර ගැනීමකින් තොරව මාසික දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.3,447,250ක් ගෙවා තිබුණි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දෙවන අදියරේ ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය සඳහා බඳවාගෙන තිබුණු මෙම නිලධාරියා සඳහා විශ්වවිද්‍යාලයේ කිසිඳු ඉදිකිරීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවූ 2022 නොවැම්බර් සිට 2023 සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් ගෙවා තිබුණු මාසික දීමනා එකතුව රු.870,000 ක් විය.	දෛනික පැමිණීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කරන අතර විශ්ව විද්‍යාල පද්ධතියේ මීට අදාළ තනතුරු සමඟ සැසඳීමක් කර ගෙවීම් නිර්ණය කරන ලද බව. ඉදිකිරීම් අවසන් වුවද ව්‍යාපෘති වල නඩත්තු කාල සීමා කාලයක් පැවතීම හේතුවෙන් එකී අධීක්ෂණය සඳහා මෙම නිළධාරියා යොදවන ලද බව.	අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකොට ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත් සිදු වූ අලාභය අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

3.6 වාහන පද්ධති කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පුස්තකාලාධිපති තනතුරේ වැඩ බලන නිලධාරියාගේ නිල රථය ලෙස මාසික කුලී පදනම මත ලබා ගත් මෝටර් රථයක් ලබා දී තිබුණු අතර 2023 ඔක්තෝබර් 07 දින නිලධාරියා විසින් පෞද්ගලික කටයුත්තක් සඳහා අනවසරයෙන් යාපනය දක්වා යාමේදී සිදුවූ අනතුර හේතුවෙන් රු.2,267,845 ක අලාභයක් තක්සේරු කර තිබුණි. එම අලාභය	මේ සම්බන්ධ අංක CL/92/2024 නඩුව බදුල්ල දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී. මෙම මෝටර් රථය විශ්වවිද්‍යාලය සතු නොවන කුලී පදනමින් ලබා ගත් වාහනයක් වීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ / මුල්‍ය සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කොට නොමැති බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 104(1),104(3), 104(4) හා රජයේ වියදම් කළමනාකරණ ප්‍රතිපත්තීන් අනුව කටයුතු කිරීමටත් කුලී රථ යෙදවීම

ප්‍රතිපූරණය කිරීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් වාහන හිමිකරු එම අලාභය අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයට එරෙහිව නඩු පවරා තිබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 6.4, 6.5 වගන්තියේ විධිවිධානයන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(1) විධිවිධානයන් නොසලකා හැර 2024 ජූලි 15 දින සිට අදාළ නිලධාරියා වෙත සජ්ත වාර්ෂික නිවාඩු අනුමත කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර තිබුණි. අනතුරට අදාළ වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා වූ පරීක්ෂණ 2024 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එමෙන්ම, නිලධාරියාගේ ප්‍රවාහන කටයුතු සඳහා මාසික කුලී පදනමින් ලබාගත් වාහනයක් හා වෙනත් කුලී රථ යෙදවීම වෙනුවෙන් අනතුර සිදු වූ දින සිට 2024 ජූලි 15 දින දක්වා රු.2,341,066 ක් වැය කර තිබුණි.		හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදල සඳහා වූ අලාභය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත 2025 ජූලි 21 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ වාර්ෂික වාර්තාව කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ඇති බව.	අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.